VERITÉ

# විදසුන්

වෙළුම 02 - කාණ්ඩය 01 ජූලි 2017

වෙරිටේ රිසර්ච් ආයතනය යනු ශ්‍රී ලංකාවේ සහ ආසියා කලාපයේ ආර්ථික, නෛතික, දේශපාලන හා ජනමාධ්‍ය ක්ෂේත්‍රයන්හි පර්යේෂණ හා විශ්ලේෂණ කටයුතුවල නියුතු වන ස්වාධීන පර්යේෂණ ආයතනයකි.

නිෂාන් ද මෙල්
විදසුන් මාලා සංස්කාරක



# තොරතුරු හිඟයෙන් පීඩා විඳින ශ්‍රී ලාංකික අපනයනකරුවෝ

**ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රගමනය අඩාල කරන අනේකවිධ හේතු අතර රාජ්‍ය නිලතන්ත්‍රයෙහි වගවීමක් නොමැතිකම ඉහළින්ම සිටී. ලංකාවේ කෘෂි අපනයනකරුවන් මුහුණ දෙන කෘෂි වෙළඳාම පිළිබඳ තොරතුරු හිඟයට ඉහත කී වගවීමක් නොමැතිකම තදින් ම බලපායිග මෙම ලිපියෙන් පිරික්සා බැලෙන්නේ කෘෂි අපනයනකරුවන් මුහුණ දෙන එකී තොරතුරු හිඟය පිළිබඳවයි. වෙළඳුන්ට අවශ්‍ය මූලිකම තොරතුරු පවා සපයා දීමට රජයේ ආයතන දක්වන පැකිළීම රාජ්‍ය නිලතන්ත්‍රය [illegible]ධිමත් කිරීමට ඇති අවශ්‍යතාවය පිළිබඳව ද ඉඟි කරයි.**

**23%**

කෘෂිකර්මාන්තයෙහි නියැලෙන ප්‍රතිශතය

**<40%**

අන්තර්ජාලයෙන් කෘෂි වෙළඳාම පිළිබඳව ලබා ගත හැකි තොරතුරු

**~20%**

අන්තර්ජාලයෙහි ඇති කෘෂි වෙළඳාම පිළිබඳ තොරතුරුවලින් යල් පැනගිය හෝ වැරදි තොරතුරු

අපනයන රටකට විදේශ විනිමය ගෙන එන ප්‍රධාන මාර්ගයකි. පසුගිය වසර 15ක කාලය තුළ ලංකාවේ අපනයන ක්ෂේත්‍රය දැඩි පසුබෑමකට ලක්ව ඇත. දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස ගත් කළ අපනයන වටිනාකම 2000 වසරේ සිට 2015 වසර වන විට 33% සිට 12.8% දක්වා පහළ වැටී තිබේ. 2014 සිට 2016 කාලය ඇතුළත අපනයන ආදායමද ඩොලර් බිලියන 11.1 සිට ඩොලර් බිලියන 10.3 දක්වා පහළ වැටී ඇත. අපනයන ප්‍රවර්ධනය සිය ආර්ථික ප්‍රතිපත්තියේ මූලික අරමුණක් බව පවසන වත්මන් රජය, විදේශ වෙළඳ ගිවිසුම් හරහා ශ්‍රී ලාංකික අපනයනකරුවන් විදේශයන්හිදී මුහුණ දෙන බාධක ඉවත් කිරීම සඳහා විශේෂ අවධානයක් යොමු කර ඇත.

අපනයන තරඟකාරීත්වය අඩාල කරන වෙළඳ බාධක විදේශයන්ට පමණක් සීමා නොවේ. දේශීය වෙළඳ බාධකද අපනයන ප්‍රවර්ධනයට විශාල බාධාවක් විය හැක. මෙම කෙටි ලිපියෙන් පෙන්වා දෙන්නේ අපනයනකරුවන් සිය රට තුළ මුහුණ දෙන, රජයට පහසුවෙන් විසඳිය හැකි, එහෙත් අඩු අවධානයක් යොමුව ඇති දේශීය වෙළඳ බාධකයක් වන, “කාලීන සහ විශ්වාසදායක තොරතුරු ලබා ගැනීමට ඇති අපහසුතාවය” පිළිබඳවයි. මෙම “තොරතුරු හිඟකම” නිසා වැඩිපුරම පීඩා විඳින්නේ කෘෂි අපනයනකරුවන්ය. අපනයන ප්‍රවර්ධනය කිරීමට නම් අපනයනකරුවන්ට කාලීන සහ විශ්වාසදායි තොරතුරු පහසුවෙන් සහ ඉක්මනින් ලබා දීමට පියවර ගැනීම ඉතා වැදගත් බව මේ හරහා පෙන්වා දී ඇත.

## මොනවද මේ තොරතුරු?

රටක ආනයන සහ අපනයන, අණ පනත් රැසකට නතු වන අතර මෙම අණ පනත්වල අනුකූල බව අධීක්ෂණය කිරීමට රාජ්‍ය ආයතන රැසක් සම්බන්ධ වේ. මෙම අණ පනත්වල අරමුණ වන්නේ ආනයනයේදී සහ අපනයනයේදී එම භාණ්ඩ-වලින් මිනිසුන්ට, සතුන්ට සහ පරිසරයට වන හානිය අවම කර ගැනීමයි. උදාහරණයක් ලෙස විදේශයන්හි සිට ආනයනය කරන කෘෂි භාණ්ඩ හරහා ආගන්තුක පළිබෝධ මෙරටට පැමිණීම වළක්වන රෙගුලාසි කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතික ශාක නිරෝධායන සේවය පිළිබඳ ආයතනය මඟින් ක්‍රියාත්මක වේ. එසේම මෙරටට අවේණික ශාක අවසරයකින් තොරව විදේශයන්ට අපනයනය වළක්වන රෙගුලාසි වන සංරක්ෂණ දෙපාර්තුමේන්තුව ක්‍රියාත්මක කරයි.

මෙම අණ පනත් සහ ඒවාට අනුකූල බව තහවුරු කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය, ඒ සඳහා ගතවන කාලය, පිරිවැය/ගාස්තු, අදාල අයදුම්පත්, ක්‍රමවේදයන් සහ ඒ සඳහා සම්බන්ධ කර ගත යුතු නිලධාරීන් සහ ආයතන පිළිබඳ තොරතුරු අපනයනකරුවෙකුට ඉතා වැදගත් වේ.

බොහෝ අපනයනකරුවන් සිය නිෂ්පාදන සඳහා ආනයනය කරන ලද අමු ද්‍රව්‍ය සහ යන්ත්‍රෝපකරණ භාවිතා කරයි. උදාහරණයක් ලෙස කෘෂි අපනයන නිෂ්පාදනයට බීජ, පැළ වර්ග, පොහොර, කෘමි නාශක, වල්නාශක, යන්ත්‍ර සූත්‍ර ආනයනය වැදගත් වේ. එබැවින් අපනයනවල සාර්ථකත්වය සඳහා ආනයන ක්‍රියාවලිය පිළිබඳ තොරතුරුද වැදගත් වේ.

## තොරතුරු පිළිබඳ ගැටලුව නිසා අපනයන ක්ෂේත්‍රයට වන අහිතකර බලපෑම

කෘෂි භාණ්ඩවල ගුණාත්මකභාවය සහ සුරක්ෂිතභාවය රැකගැනීම ජනතාවගේ සෞඛ්‍ය සහ පරිසරය ආරක්ෂා කර ගැනීමට ඉතා වැදගත් වන බැවින්, කෘෂි ආනයන සහ අපනයන අනෙකුත් භාණ්ඩවලට වඩා වැඩි නීති සහ රෙගුලාසි සමූහයකට යටත්ව කළ යුතු වේ.

මෙම රෙගුලාසිවලට අනුකූලව අපනයන සහ ආනයන කිරීමට ව්‍යාපාරිකයන් දිරිගැන්වීම අදාල රාජ්‍ය ආයතනවල යුතුකමකි. මෙහිදී එම අණ පනත් සහ ක්‍රියාපටිපාටි පිළිබඳ විශ්වාසදායී තොරතුරු නිසි කලට අපනයනකරුවන්ට ලබා දීම එම ආයතනවල වගකීමකි.

එහෙත් වෙරිටේ ආයතනය කෘෂි අපනයන පිළිබඳ කළ පර්යේෂණයකින් හෙළි වුයේ මෙම තොරතුරු ලබාගැනීම දුෂ්කර කාර්යයක් බවයි. කාලීන සහ විශ්වාසදායි තොරතුරු නොමැති වීම නිසා ආනයන සහ අපනයන ක්‍රියාවලියේ විනිවිදභාවය අඩු වන අතර, මෙය නීති උල්ලංඝනය කරමින් වෙළඳාමේ යෙදෙන ව්‍යාපාරිකයන්ට සහ ඔවුනට උල්පන්දම් දෙමින් තම මඩිය තර කරගන්නා නිලධාරීන්ට තෝතැන්නක් සදා දෙයි. මෙනිසා, ලංකාවේ අපනයන ප්‍රතිරූපයට විශාල හානියක් විය හැකි අතර, ලංකාවේ අපනයන විදේශ රටවල තහනමකට පවා ලක්වීමට එමඟින් ඉඩ සලසා දෙයි.

රෙගුලාසි සහ ක්‍රියාපටිපාටිවල වන වෙනස්වීම් පිළිබඳව නිසිකලට අපනයනකරුවන් දැනුවත් කිරීමට රාජ්‍ය ආයතන කටයුතු නොකිරීම විශාල ගැටලුවකි. මෙවැනි අවස්ථාවල අපනයන භාණ්ඩ රෙගුලාසි සමග අනුගත නොවීම නිසා හෝ අදාල ලියකියවිලි නොමැති වීම නිසා ගුවන් තොටුපළේදී/වරායේදී අදාල රාජ්‍ය ආයතන විසින් රඳවා ගැනීම නිසා වන ප්‍රමාදයන් අපනයන තරඟකාරිත්වයට අහිතකර ලෙස බලපායි.

මෙම ප්‍රමාදයන් කල් තබා ගත නොහැකි කෘෂි භෝග අපනයනවල තරඟකාරීත්වයට දැඩිව බලපායි. ප්‍රමාදවන සෑම මිනිත්තුවක් පාසාම ඉහත කී භෝගවල නැවුම්භාවය මෙන්ම ගුණාත්මකභාවය පහළ යෑම මීට හේතුවයි. මෙවැනි ප්‍රමාදයන් නිසා අපහසුතාවට පත්වන අපනයනකරුවන් නිලධාරීන්ට අමතර මුදලක් ලබා දී හෝ තම අපනයන නියමිත වෙලාවට ගැනුම්කරුව අතට පත් කිරීමට උත්සාහ දරයි. මෙවැනි අමතර වියදම්ද අපනයන තරඟකාරීත්වයට අහිතකර ලෙස බලපායි.

### වෙබ් අඩවි හරහා තොරතුරු ලබා දීමට පැකිලෙන රාජ්‍ය ආයතන

වෙබ් අඩවි පහසුවෙන් හා අඩු පිරිවැයකින් තොරතුරු පළ කිරීමේ ක්‍රම අතර මුල් තැනක් ගන්නේ ඕනෑම පුද්ගලයෙකුට ස්ථානය හෝ වෙලාව නොතකා අවශ්‍ය කරුණු පහසුවෙන් දැනගැනීමට එයින් ඉඩකඩ සැලසෙන බැවිනි. වෙබ් අඩවි හරහා තොරතුරු ලබා ගැනීමට ඇති හැකියාව නිසා වැඩි සහනයක් ලැබෙන්නේ කොළඹින් පිට සිටින ව්‍යාපාරිකයන්ටයි. තොරතුරු ලබා ගැනීමට කොළඹට පැමිණ නාස්ති කිරීමට සිදුවන කාලය සහ පිරිවැය මෙමඟින් විශාල ලෙස අඩු කර ගත හැක.

වර්තමානය වන විට ආනයන අපනයන නියාමනය කරන රාජ්‍ය ආයතන සියල්ලටම පාහේ වෙබ් අඩවියක් පවතී. එහෙත් අවාසනාවකට මෙන් මෙම වෙබ් අඩවි හරහා අපනයනකරුවන්ට සහ ආනයනකරුවන්ට අවැසි තොරතුරු ලබා දීමට මෙම ආයතන අසමත් වී ඇත. වෙරිටේ පර්යේෂණ ආයතනය මඟින් කෘෂි නිෂ්පාදන ආනයන හා අපනයනයන සම්බන්ධ රෙගුලාසි නියාමනය කරන කාර්යාංශ කිහිපයක වෙබ් අඩවිවල ඇති තොරතුරු පිළිබඳව 2017 වසරේ මැයි මාසයේදී කළ සමීක්ෂණයකින් පෙනී ගියේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතන තොරතුරු ලබා දීම සම්බන්ධයෙන් දැඩි පසුගාමිත්වයක් දක්වන බවයි. (වගුව 1 බලන්න).

පහත වගුවෙන් පෙන්වා දී ඇත්තේ කෘෂිභෝග වෙළඳාමට අදාළව තෝරාගත් රාජ්‍ය ආයතන කිහිපයක වෙබ් අඩවි පිළිබඳව සිදුකළ මූලික තොරතුරු විගණනයේදී හෙළි වූ කරුණුයි. කොළ පැහැති කොටුවලින් වෙබ් අඩවි මඟින් අත්‍යවශ්‍ය ප්‍රාථමික තොරතුරු ඉදිරිපත් කර තිබීමට පියවර ගෙන ඇති බව දක්වන අතර, තොරතුරු ලබාදීමට කිසිදු උත්සහයක් දරා නොතිබීම රතු පැහැති කොටුවලින් දක්වා ඇත.

තොරතුරුවල යාවත්කාලීන බව කොළ පැහැති හරි ලකුණකින් දක්වා ඇති අතර, රතු පැහැති කතිර සළකුණෙන් කියැවෙන්නේ ලබා දී ඇති තොරතුරු යාවත්කාලීන නොවන බවයි.

වගුව 1: අදාල රාජ්‍ය ආයතන වෙබ් අඩවිවල පළ කර ඇති තොරතුරු සහ ඒවායේ නිරවද්‍යතාවය

| ආයතනය | වෙබ් අඩවි | සම්බන්ධී කරණ තොරතුරු | නිවැරදි අයදුම්පත් ආකෘති | ගතවන කාලය | අදාළ ගාස්තු | තහනම් කිරීම් හෝ සීමා කිරීම් | අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය |
|---|---|---|---|---|---|---|---|
| ජාතික ශාක නිරෝධායන සේවය | *doa.gov.lk, gic.gov.lk* | ✓ | ✓ | ✓ | × | ✓ | ✓ |
| වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | *forestdept.gov.lk gic.gov.lk* | ✓ | × | ✓ | | | × |
| ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | *fisheriesdept.gov.lk, gic.gov.lk* | ✓ | | | | | |
| බීජ සහතික කිරීම සහ පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානය | *doa.gov.lk, gic.gov.lk* | × | ✓ | | | | |
| ජාතික පොහොර ලේකම් කාර්යාලය | *agrimin.gov.lk, gic.gov.lk* | | | | | | |
| පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය | *doa.gov.lk, gic.gov.lk* | × | ✓ | × | × | | × |
| ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුව | *imexport.gov.lk* | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |

*මූලාශ්‍රය: වෙරිටේ පර්යේෂණ ආයතනය, 2017 මැයි 19 දිනට අනුව*

ඉහත සමීක්ෂණයෙන් හෙළි වූ ප්‍රධාන කරුණක් නම් බොහෝ රාජ්‍ය ආයතනවලට අදාළ වෙබ් අඩවි තිබුණද ඒවායෙහි ඇති තොරතුරු සීමිත වන බව සහ බොහෝ තොරතුරු යල් පැනගිය ඒවා බවයි. සම්බන්ධීකරණ තොරතුරු, අයදුම්පත්, රෙගුලාසි, ක්‍රියාපටිපාටි හා ගාස්තු වැනි ප්‍රාථමික තොරතුරු පවා සිය වෙබ් අඩවි හරහා ලබා දීමට මෙම ආයතන අසමත් වී ඇත. (වැඩිදුර තොරතුරු සඳහා 1 වගුව ද, විශ්ලේෂණය සඳහා 2 වගුව ද බලන්න)

මෙම මූලික තොරතුරු පිළිබඳ සමීක්ෂණයෙන් හෙළි වූ කරුණු 2 වගුවෙහි සරල ආකාරයෙන් දක්වා ඇත.

### වගුව 2: වෙබ් අඩවි හරහා පළ කර ඇති මූලික තොරතුරු පිළිබඳ විශ්ලේෂණය

<table>
<tr><th>තොරතුරු සැපයීමට</th><th>උත්සාහයක් දරා ඇත</th><th>උත්සාහයක් දරා නොමැත</th></tr>
<tr><td>යාවත්කාලීන තොරතුරු දක්වා ඇත</td><td>38%<br>[16/42]</td><td rowspan="2">43%<br>[18/42]</td></tr>
<tr><td>යාවත්කාලීන තොරතුරු දක්වා නැත</td><td>19%<br>[8/42]</td></tr>
</table>

*මූලාශ්‍රය: වෙරිටේ පර්යේෂණ ආයතනය, 2017 මැයි 19 දිනට අනුව*

2 වගුවෙන් පෙන්වා දෙන පරිදි, ආයතනයට අදාළ වෙබ් අඩවියෙන් හෝ රාජ්‍ය තොරතුරු කේන්ද්‍රයෙහි වෙබ් අඩවියෙන් (gic.gov.lk) විධිමත් ලෙස තොරතුරු ලබා දීමට උත්සාහයක් දරා ඇත්තේ ආයතන අඩකට මදක් වැඩි ප්‍රතිශතයකි. මෙම ලබා දී ඇති තොරතුරු වලින්ද තුනෙන් එකක් පමණ යල් පැනගිය, භාවිතයට ගත නොහැකි තොරතුරු වේ.

සමස්තයක් වශයෙන් ගත් කළ, 1 වගුවේ අවධානයට ලක් කළ දත්ත 42ක් අතුරින් යාවත්කාලීන තොරතුරු ලෙස දැක්විය හැක්කේ 38%ක් වැනි සුළු ප්‍රතිශතියකි.  62%ක් වූ සෙසු තොරතුරු ලබා ගැනීමට නම් එම ආයතන වෙත පෞද්ගලිකව පැමිණිය යුතු අතර, නිවැරදි දුරකථන අංක සහ අදාළ නිලධාරීන් පිළිබඳ තොරතුරු වෙබ් අඩවියෙන් ලබාගැනීමේ හැකියා-වක් ඇත්නම් එම තොරතුරු දුරකථනය මඟින් දැන ගත හැක.

### තොරතුරු ගැටලුවට රජයෙන් දැනට යෝජිත විසඳුම්

නිසි කලට නිරවද්‍ය තොරතුරු ලබා ගැනීමට ඇති අපහසුතාව ගැටලුවක් ලෙස වත්මන් රජය පිළිගෙන තිබේ. බොහෝ කලක් ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ අවධානය යොමු නොවුණ මෙම ගැටලුව ප්‍රමාද වී හෝ රජයේ අවධානයට ලක් වීම ප්‍රශං-සනීය කරුණකි.

එපමණක් නොව පසුගිය අයවැය යෝජනා අතර මෙයට විසඳුමක් ද රජය විසින් ඉදිරිපත් කරන ලදී. ජාතික වෙළඳ තොරතුරු කේන්ද්‍රය (ජා. වෙ. තො. කේ.) නමින්  වෙබ් අඩවියක් ස්ථාපනය කිරීම එම විසඳුමයි. මෙම තොරතුරු කේන්ද්‍රය හරහා වෙළඳුන්ට එකම ස්ථානයකින්, අන්තර්ජාලය හරහා වැඩි පරිශ්‍රමයක් නොයොදා අදාළ නීති රෙගුලාසි, ගාස්තු හා ක්‍රියාපටිපාටි පිළිබඳ තොරතුරු දැනගැනීමට හැකි වනු ඇත.

බංග්ලාදේශය, මියන්මාරය, ඉන්දියාව හා කාම්බෝජය වැනි බොහෝ රටවල් ආනයනයේදී සහ අපනයනයේදී පැන නඟින අනේකවිධ තොරතුරු ගැටලුවලට විසඳුමක් ලෙස මෙවැනි තොරතුරු කේන්ද්‍ර පිහිටුවීමට පියවර ගෙන ඇත.

කෙසේවෙතත්, ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්තිමය ඉතිහාසය දෙස හැරී බැලූ විට නම් මෙවන් යෝජනා සාර්ථකව ක්‍රියාත්මක කිරීම පිළිබඳව දැඩි සැක සංකා මතු වේ. බොහෝ විට මෙවැනි සාධනීය විසඳුම් රාජ්‍ය නිලතන්ත්‍රයේ නිද්‍රාශීලීභාවය හා වගවීමක් නොමැතිකම හමුවේ අසාර්ථක වූ අවස්ථා බොහෝ ඇත.

එසේම යෝජිත තොරතුරු කේන්ද්‍රය රජය විසින් තොරතුරු කේන්ද්‍රගත කිරීමට තැබූ ප්‍රථම පියවර ද නොවේ. 2007 වසරේදී ශ්‍රී ලංකා රේගුව විසින් අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද ආයතනයෙහි (USAID) සහායද ඇතිව ආනයන සහ අපනයනවලට අදාළ රෙගුලාසි පිළිබඳ දත්ත ඇතුළත් තොරතුරු කේන්ද්‍රයක් පිහිටුවන ලදී. මෙහි අභිප්‍රාය වූයේ මුද්‍රිත පිටපත් ලෙස විවිධ ආයතනවල විසිරී පවතින ලියවිලි හරහා තොරතුරු ලබා ගැනීමේදී වෙළඳුන් මෙන්ම රේගු නිලධාරීන්ද මුහුණ දෙන අපහසුතා අවම කර ගැනීමයි. තරගකාරීත්වය වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (TCP) යටතේ ක්‍රියාත්මක කරන ලද මෙම ව්‍යායාමය ක්‍රියාවට නැංවීම පිණිස සැළකිය යුතු වෙහෙසක් දැරීමට සිදුවිය. මෙම ව්‍යාපෘතිය යටතේ මහත් පරිශ්‍රමයක් දරා අදාළ සියලු නීති, රෙගුලාසි හා ක්‍රියා පටිපාටි එකතු කර ඒවා වර්ගීකරණය කොට ඩිජිටල්කරණය කර කේන්ද්‍රීය දත්ත ගබඩාවක් ස්ථාපිත කරන ලදී. මෙම දත්ත ගබඩාවේ තොරතුරු රේගු වෙබ් අඩවිය (customs.gov.lk) ඔස්සේ ඕනෑම පුද්ගලයෙකුට ලබාගැනීමේ පහසුව සලසා දෙන ලදි. මෙසේ අති මහත් වෙහෙසක් සහ වියදමක් දරා ස්ථාපිත කෙරුණු අතිශයින් ඵලදායී මෙම දත්ත ගබඩාව අදාළ ආයතනවල නිලධාරීන් මැනවින් නඩත්තු නොකිරීම හේතුවෙන් අද වනවිට සම්පූර්ණයෙන්ම අකර්මණ්‍ය වී ඇත. මෙය සැබවින්ම ඛේදජනකය.

රෙගුලාසි පිළිබඳ දත්ත ඇතුළත් වෙබ් අඩවිය මඟින් ලත් අත්දැකීම් යෝජිත තොරතුරු කේන්ද්‍රය ස්ථාපිත කිරීමට ප්‍රථම සැලකිය යුතු වැදගත් කරුණක් පිළිබඳව පෙරවදනක් සපයයි. එනම් දැනට පවතින වෙබ් අඩවි හරහා තොරතුරු ලබා දීමට පැකිලෙන සහ තොරතුරු සීමිතකම නිසා පීඩා විඳින අපනයනකරුවන්ගෙන් පෞද්ගලික ලාභ ප්‍රයෝජන ලබන්නට පුරුදු වී සිටින නිලධාරීන් සිටින පරිසරයක මෙවැනි සංකීර්ණ තොරතුරු කේන්ද්‍රයක් පිහිටුවීම මඟින් තොරතුරු ගැටලුවට තිරසාර විසඳුමක් ලබා ගත නොහැකි බවයි. එම ගැටලුවට ස්ථිර විසඳුමක් සෙවීමට නම් රාජ්‍ය නිල තන්ත්‍රයෙහි තොරතුරු ලබා දීමට ඇති අකමැත්ත සහ/හෝ අසමත්බව යන ගැටලු විසඳීම කෙරෙහි මූලික අවධානය යොමු කළ යුතු බව මෙම විශ්ලේෂණය පෙන්වා දෙයි. එසේ නොවුවහොත් යෝජිත තොරතුරු කෙන්ද්‍රයටද ඊට පෙර ස්ථාපිත රෙගුලාසි දත්ත ගබඩාවට අත් වූ ඉරණම ම අත් වනු ඇත.

වැඩි තොරතුරු පිණිස publications@veriteresearch.org වෙත ලියන්න.


සියලු හිමිකම් ඇවිරිණි © 2017 වෙරිටේ රිසර්ච්